සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ගෘහ ආර්ථික විද්‍යාව - I

13 ශ්‍රේණිය | **කාලය පැය 02 යි.**

<u>සැලකිය යුතුයි.</u>

- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 50 තෙක් ප්‍රශ්නවලදී ඇති (1), (2), (3). (4), (5) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර

---

(01) බහුකාර්ය ඒකකයක් ලෙස ගෘහයේ කොටස් යොදාගැනීම හැඳින්වූයේ,

(1) සංසරණය ලෙසය. (2) ඉඩකඩ ලෙසය. (3) නම්‍යතාවය ලෙසය.
(4) රාශිකරණය ලෙසය. (5) අපේක්ෂා ලෙසය. (......)

(02) වර්ණයක අගය වෙනස් කිරීමට උපයෝගී වන වර්ණ පහත සඳහන් වර්ණ අතරින් තෝරන්න.

(1) රතු, නිල් (2) කලු, සුදු (3) රතු, කොළ
(4) කහ, කොළ (5) කහ, දම් (......)

(03) නිවසට ස්භාවික ආලෝකය ලබාගැනීමේදී නිදන කාමරයක් සඳහා වඩාත් සුදුසු වන්නේ මින් කුමන වීදුරු සහිත ජනේලද?

(1) පාරභාෂක විනිවිද නොපෙනෙන වීදුරු (2) පාරභාෂක විනිවිද පෙනෙන වීදුරු
(3) පාරාන්ධ විනිවිද පෙනෙන වීදුරු (4) පාරාන්ධ විනිවිද නොපෙනන වීදුරු
(5) පාරදෘශ්‍ය විනිවිද පෙනෙන වීදුරු (......)

(04) 

මෙම තිර රෙදි යෙදීමේ ක්‍රමය නම් කරනු ලබන්නේ,

(1) ප්‍රිසිලා ලෙසය. (2) ක්‍රිස්කෝස් ලෙසය.
(3) කැෆේ ලෙසය. (4) ටියර් ලෙසය.
(5) කොටේජ් සෙට් ලෙසය. (......)

(05) එක් දිසාවකට පමණක් ජලය ගමන් කිරීමට ඉඩ සැලැස්වීම සිදු කරන කපාටය වනුයේ,

(1) දොරටු කපාටය (2) පාකපාටය (3) බෝල කපාටය
(4) නැවතුම් කපාටය (5) ගුලා කපාටය (......)

(06) මුහුණට මුහුණලා දොර ජනෙල් සැලසුම් කළ ගෘහ නිර්මාණ ශිල්පියෙකුගේ අපේක්ෂාව නොවනුයේ,

(1) සිරස් සංවාතනය ලබා ගැනීමටය. (2) ආලෝකය ලබා ගැනීමටය.
(3) වාතාශ්‍රය ලබා ගැනීමටය. (4) තිරස් සංවහනය ලබා ගැනීමටය.
(5) ආලෝකය හා වාතාශ්‍රය ලබා ගැනීමටය. (......)

(07) නිපදවන වායුමය අපද්‍රව්‍ය ප්‍රමාණය වැඩිම උඳුන් වර්ග තෝරන්න.

(1) ක්ෂුද්‍ර තරංග උඳුන (2) ටිම්කෝ උඳුන (3) දර ලිප
(4) ගෑස් උඳුන (5) තප්ත උඳුන (......)

(08) $C_{12}H_{12}O_{11}$ අණුක සූත්‍රයට අයත් ආහාර වර්ගය විය හැක්කේ,

(1) මී පැණිය (2) බතලය (3) කිරිය
(4) බීට් සීනිය (5) පේරය (......)

(09) කාබන් දාමයෙහි ද්විත්ව බන්ධන 02 ක් හෝ ඊට වැඩියෙන් අඩංගුව ඇත්තේ,

(1) ඇස්කොබික් අම්ලයෙහිය. (2) ඇරකිඩොනික් අම්ලයෙහිය.
(3) ස්ට්‍රියරික් අම්ලයෙහිය. (4) පාමටික් අම්ලයෙහිය.
(5) ස්ට්‍රිට්‍රික් අම්ලයෙහිය. (......)

(10) යකඩ අවශෝෂණය වේගවත් කරන සාධකයක් වනුයේ,

(1) ඔක්සැලික් අම්ලය (2) ෂයින් අම්ලයෙහි ය. (3) කැල්සියම්ය
(4) ආහාරමය තන්තුය (5) කබනික අම්ලය (......)

(11) සිරුර තුළ සෘණ නයිට්‍රජන් තුළනයක් පවතින අවස්ථාවක් ලෙසට සැලකිය හැක්කේ,

(1) ගර්භණී අවධියේ (2) යොවුන් අවධියේ (3) ළදරු අවධියේ
(4) රෝගී අවධියේ (5) නිරෝගී අවධියේ (......)

(12) ශරීර ස්කන්ධ දර්ශකය (B.M.I) 16 වූ තැනැත්තෙකු,

(1) ස්ථුලය (2) අඩු බරය (3) අධි බරය
(4) මන්දපෝෂිතය (5) සමබරය (......)

(13) "කිචරි" පිළියෙල කළ ගෘහ ආර්ථික විද්‍යා සිසුවිය පරිප්පුවල බහුල යයි සඳහන් කළේ,

(1) ලයිසීන්ය. (2) හිස්ටිඩීන්ය. (3) මෙතියොනික්ය.
(4) වේලන්ය. (5) ආර්ජිනීන්ය. (......)

(14) A - අඩු බර දරු උපත් B - රාත්‍රී අන්ධතාව C - ගලගණ්ඩය
D - රුධිර හිමොග්ලොබින් මට්ටම අඩු වීම.

ඉහත පෝෂණ ගැටලු අනුපිළිවෙල නිවැරදිව සඳහන් වනුයේ,

(1) මන්ද පෝෂණය, අයඩීන් ඌණතාවය, A ඌණතාවය, නීරක්තිය.
(2) දුෂ් පෝෂණය, A ඌණතාවය, අයඩීන් ඌණතාවය, නීරක්තිය.
(3) මන්ද පෝෂණය, A ඌණතාවය, අයඩීන් ඌණතාවය, නීරක්තිය.
(4) දුස් පෝෂණය, අයඩීන් ඌණතාවය, නීරක්තිය, A ඌණතාවය.
(5) මන්ද පෝෂණය, A ඌණතාවය, නීරක්තිය, අයඩීන් ඌණතාවය. (......)

(15) ප්‍රතිසජලන ද්‍රාව්‍යයක අඩංගු වනුයේ,

(1) ජලය, යකඩ, ග්ලුකෝස් හා සෝඩියම්ය.
(2) ජලය, සෝඩියම්, පොටෑසියම් හා ග්ලුකෝස්ය.
(3) ජලය, මැග්නීසියම්, පොටැසියම් හා ග්ලුකෝස් ය.
(4) ජලය, සල්ෆර්, මැග්නීසියම් හා ග්ලුකෝස්ය.
(5) ජලය, යකඩ, මැග්නීසියම් හා ග්ලුකෝස්ය. (......)

(16) කෘත්‍රිම තෛලෝදකයක් විය හැක්කේ,

(1) ප්‍රොපිලීන්ය. (2) සෝඩියම් නයිට්රේට්ය. (3) මෙලනීන්ය.
(4) ග්ලිසරෝල්ය. (5) සෝර්බිටෝල්ය. (......)

(17) තිරිඟු පිටිවල ප්‍රමාණයෙන් 25% ක් පමණ මඳ උණුසුම් ජලය එකතු කර පිටි මෝලියක් සකස් කර සාදා ගනු ලබන ආහාරය විය හැක්කේ,

(1) හබල පෙතිය (2) නූඩ්ල්ස්ය (3) විස්කෝතුය
(4) ලසානිය (5) කේසරිය (......)

(18) ආහාර වෙළඳ ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ නිර්දේශය ලබා දෙනුයේ,

(1) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගිනි.
(2) මිනුම් ඒකක, ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුව මගිනි.
(3) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගිනි.
(4) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය මගිනි.
(5) මහජන සෞඛ්‍ය පරීක්ෂක මගිනි. (......)

(19) පරිවෘත්තීය ආබාධයක් ලෙස හැඳින්විය හැක්කේ,

(1) අධිරුධිර පීඩනය (2) හෘද රෝග (3) ගැස්ට්‍රයිටීස්
(4) පිලිකා (5) දියවැඩියාව (......)

(20) ශරීර ස්කන්ධ දර්ශකය නිවැරදිව ගණනය කරගත් හෙදිය ඒ සඳහා උපයෝගී කොට ගත් සමීකරණය වනුයේ,

(1) $\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \dfrac{\text{ශරීරයේ බර (කි්‍ර. ග්‍රෑම් වලින්)}}{\text{උස}^2 \text{ (මීටර වලින්)}}$

(2) $\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \dfrac{\text{උස}^2 \text{ (මීටර වලින්)}}{\text{ශරීරයේ බර (කි්‍ර. ග්‍රෑම් වලින්)}}$

(3) $\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \dfrac{\text{ශරීරයේ බර (කි්‍ර. ග්‍රෑම් වලින්)}}{\text{උස (මීටර වලින්)}}$

(4) $\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \dfrac{\text{ශරීරයේ බර (මීටර් වලින්)}}{\text{උස}^2 \text{ (මීටර වලින්)}}$

(5) $\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \dfrac{\text{ශරීරයේ බර}^2 \text{ (කි්‍ර. ග්‍රෑම් වලින්)}}{\text{උස (මීටර වලින්)}}$ (......)

(21) බේකරි නිෂ්පාදිත ආහාරයට ගැනීමෙන් වැළකීමට වෛද්‍ය උපදෙස් ලැබූ තැනැත්තෙකුට වැළඳී ඇත්තේ,

(1) මල බද්ධය (2) තීරක්තිය (3) මන්ද පෝෂණය
(4) ගැස්ට්‍රයිටීස් (5) මාන්දම (......)

(22) සුඩදත් 111 ප්‍රතිකාරකය ආහාර පරීක්ෂණයක් සඳහා රසායනාගාරයේ එකතු කළේ,

(1) පාන් වලටය. (2) පරිප්පු වලටය. (3) පොල් වලටය.
(4) බත් වලටය. (5) කැරට් වලටය. (......)

(23) සවස තේ පානය සඳහා "ඉත්තලෙයාස්" සෑදූ තිළිණිගේ මව ඒ සඳහා යොදා ගත් පිටි මෝලිය වූයේ,

(1) ෂෝට් ක්‍රස්ට්ස් (2) පෆ්ය (3) ෂූය
(4) දියාරුය (5) ඝනය (......)

(24) උෂ්ණත්වය 120°C තප්පර 6 සිට විනාඩි6 දක්වා තබා ගනුයේ,

(1) පැස්ටරීකරණයේදී ය. (2) ජීවාණුහරණයේදී ය. (3) බ්ලාන්ච් කිරීමේදී ය.
(4) පොලිඑතිලීන්ය. (5) ඇලුමිනියම් ෆොයිල්ය. (......)

(25) "X" නමැති ආහාරය සකස් කිරීම සඳහා ඔලිව් තෙල්, විනාකිරි, සුදුළූණු, ගම්මිරිස්, සීනි, සහ ලුණු යොදා ගන්නා ලදී. "X" විය හැක්කේ,

(1) ප්‍රංශ සලාද වැස්මය (2) මයෝනිස් වැස්මය. (3) ක්‍රීම් වැස්මය
(4) චීන වැස්මය (5) ඉන්දියානු වැස්මය. (......)

(26) ස්පොන්ජ් කේක් සෑදීමේ දී ඔබ භාවිතටය නොගත් දෑ පහත සඳහන් ද්‍රව්‍ය ඇසුරින් තෝරන්න.

(1) පිටි (2) මාගරින් (3) සීනි
(4) බිත්තර (5) වැනිලා (......)

The National e-Learning Portal for The General Education

(27) පිටි, මාගරින්, අයිස් වතුර, ලුණු එකතු කර සාදා ගනුයේ,

(1) ෂූ පිටි මෝලිය (2) පෆ් පිටි මෝලිය (3) ෂෝට් ක්‍රස්ට් පිටි මෝලිය

(4) දියාරු පිටි මෝලිය (5) ඝන පිටි මෝලිය (......)

(28) ප්‍රමාණාත්මක බව, රුචිය, සැහැල්ලු බව වැඩි දියුණු වන්නා වූ පිළියෙළ කිරීමේ ක්‍රමයට නිදසුනකි.

(1) උප්පුම (2) සෝයා ටෙම්පේ (3) ලසානි

(4) කිචරි (5) ආප්ප (......)

(29) පිරිසිදු පානීය ජලයෙහි සුළු ප්‍රමාණයක් අන්තර්ගතව තිබිය හැක්කේ,

(1) ප්ලුවොරයිඩ්ය (2) ක්ලෝරයිඩ්ය. (3) සෝඩියම් බයි කාබනේට්ය.

(4) ක්ලෝරීන්ය. (5) අයඩින්ය. (......)

(30) විටමින් A ඌණතාවය නිසා ඇතිවන රෝග තත්ත්වය හඳුන්වන්න.

(1) මැරස්මස් (2) ක්වෝෂියොකොර් (3) පෙලග්‍රා

(4) නිරොප්තැල්මියා (5) ගලගණ්ඩය (......)

(31) පෝෂණ ඌණතාවයක්ලෙස හඳුන්වන්නේ,

(1) යම්කිසි පෝෂකයක් හිඟවීම.

(2) යම්කිසි පෝෂකයක් කෙටි කාලීන නොලැබීම.

(3) කිසියම් පෝෂ්‍ය පදාර්ථයක් හෝ කීපයක් දිගු කාලීනව නොලැබීම.

(4) සමබල ආහාර වේලක් නොගැනීම.

(5) අක්‍රමවත් ආහාර වේලක් ගැනීම. (......)

(32) ආහාරයක ගුණාත්මක බව තීරණය වන්නේ,

(1) වයනය, පෝෂණ අගය, නොමේරූ බව, වියළි බව.

(2) උෂ්ණත්වය, සෞඛ්‍යය ආරක්ෂිත බව, සගන්දය, වර්ණය

(3) වයනය, සෞඛ්‍යය ආරක්ෂිත බව, සගන්දය, තෙතමනය

(4) වයනය, පෝෂණ අගය, සෞඛ්‍ය ආරක්ෂිත බව, රසය

(5) සගන්ධය, වියළි බව, උෂ්ණත්වය, වර්ණය, වියළි බව (......)

(33) විටමින් C වැඩිපුරම අඩංගු ආහාරයකි.

(1) නෙල්ලි (2) අඹ (3) ඇපල්

(4) මිදි (5) දෙහි (......)

(34) ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන පෝෂණ ඌණතාවයක්ය.

(1) මැරස්මස්, කොවෝෂියොකර්, ගලගණ්ඩය

(2) නීරක්තිය, ගලගන්ඩය, ක්ෂිරොක්තැලිමියාව

(3) ගලගණ්ඩය, මැරස්මස්, බැරිබැරියාව

(4) ප්‍රෝටීන් ඌණතාවය, නීරක්තිය, පෙලෙග්‍රා

(5) ෂිරොප්තැල්මියාව, සීතාදරෝගය, රිකට්ස්ය (......)

(35) යොවුන් විය හඳුන්වන කාල පරාසය වනුයේ,

(1) අවු. 10 අවු. 15 (2) අවු. 12 අවු. 20 (3) අවු. 14 අවු. 16

(4) අවු. 19 අවු. 20 (5) අවු. 10 අවු. 19 (......)

(36) යොවුන් වියේ ලක්ෂණයක් නොවන්නේ,

(1) විරුද්ධ ලිංගිකයන් සමඟ සම්බන්ධතා පැවැත් වීම.

(2) සමවයසේ කණ්ඩායම් ඇසුර

(3) ශාරීරික වෙනස්කම් ඇතිවීම.

(4) වැඩිපුර කෑම ගැනීමට කැමැත්ත

(5) පමණට වඩා නිදහසේ නොසිටීම. (......)

(37) පසු ළමාවියේ කායික වර්ධනය කෙරෙහි බලපාන සාධකයක් නොවන්නේ,

(1) ආරය (2) කායික පරිණතිය (3) දේශ ගුණය

(4) ස්ත්‍රී පුරුෂ බව (5) උෂ්ණත්වය (......)

(38) පසු ළමාවිය තුළ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි.

(1) පූර්ණ ළමා වියට සාපේක්ෂව සීග්‍ර වර්ධනය (2) මොලේ වර්ධනය අසම්පූර්ණ වීම.

(3) චාලක වර්ධනය ආරම්භ වීම. (4) කිරි දත් වෙනුවට ස්ථිර දත් ඒම.

(5) ගැහැණු ළමුන්ගේ වර්ධනයට වඩා පිරිමි ළමුන්ගේ වර්ධනය වේගවත් ය. (......)

(39) පසු ළමාවියේ දරුවන් පිළිබිඹු කරන ප්‍රසන්න භාවිතයන් අඩංගු නිවැරදි වරණය වන්නේ,

(1) රූපය, තරහා, සතුට, ආදරය (2) ශෝකය, ඊර්ෂ්‍යාව, ප්‍රමෝදය, සෙනෙහස

(3) සතුට, ආදරය, සෙනෙහස, කරුණාව (4) පසුතැවිලි වීම, තරහා, කෝපය, බිය

(5) ආදරය, සතුට, ප්‍රමෝදය, ශෝකය (......)

(40) පසු ළමාවියේ ඊර්ෂ්‍යාව පෙන්නුම් කරන ආකරය නොවන්නේ,

(1) විවිධ කතා ගොතා කීම.

(2) අපහාස උපහාස ලෙස භාෂාව හැසිර වීම.

(3) ඊර්ෂ්‍යාව ඍජුව ප්‍රකාශ නොකර වක්‍රව ප්‍රකාශ කිරීම.

(4) පිළිකුල් කිරීම.

(5) කෙළින්ම දබර කර ගැනීම හෝ දබරයට පොළඹවා ගැනීම. (......)

(41) අවුරුදු 6 7 වන විට දරුවා ආත්ම කේන්ද්‍රීය කථනයෙන් මිදී සමාජ අනුයෝගී කතනයට යොමු වේ. සමාජ අනුයෝගී කථන අවස්ථා සඳහා නිවැරදි වර්ණය වනුයේ,

(1) තොරතුරු හුවමාරු නොකිරීම, විවේචනයෙන් තොර වීම.

(2) විවේචනය නොකිරීම, තර්ජන කිරීම.

(3) ප්‍රශ්න සහ පිළිතුරු, විවේචනය

(4) අණකිරීම්, විවේචන නොකිරීම.

(5) තොරතුරු හුවමාරුව, ඉල්ලීම් නොමැති වීම. (......)

(42) පසු ළමාවියේ දරුවාගේ සමාජ ජීවිතයේ දී දක්නට ලැබෙන යහපත් හැසිරීම් රටාව නොවන්නේ,

(1) සහයෝගය, තරගකාරී බව. (2) ප්‍රතිශේදි වාදි බව දබර කරීම.

(3) මිත්‍රශීලි බව, ආත්ම කේන්ද්‍රිය බව. (4) උසුළු විසිළු කිරීම, විරුද්ධ ලිංගික විරෝධතාව

(5) අනුකරණය, ත්‍යාගශීලී බව. (......)

(43) භාෂා සංවර්ධනය කෙරෙහි බලපාන සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) බුද්ධි මට්ටම (2) යහපත් සංස්කෘතික පසුබිම

(3) සන්නිවේදන මාධ්‍යයන්ගේ බලපෑම. (4) වැඩිහිටියන්ගේ භාෂා රටාව බල නොපෑම.

(5) කථන හා ශ්‍රවණ ඉන්ද්‍රියයන්ගේ නිරෝගී බව (......)

44) රෙදි වර්ණ ගැන්වීම සම්බන්ධයෙන් නිමාලි පහත සඳහන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරයි.

A - ඩයි වර්ගයේ ස්ථිර බවක් ඇති කිරීම.

B - එය රෙද්දට හොඳින් අවශෝෂණය කර ගැනීම.

C - රෙද්දට අලංකාරයක් ගෙන දීම.

D - ඩයි වර්ගය හොඳින් දියකර ගැනීම.

E - රෙද්දට විශේෂ මෝස්තරයක් යෙදීම.

මේ අතුරින් 6 ගස්ථාපයක් ප්‍රයෝජනය වන්නේ,

(1) B හා C (2) A හා B (3) C හා D

(4) D හා E (5) C හා E (......)

(45) පහතින් දැක්වෙන්නේ කෙන්ද්‍රක දික් හා හරස් කඩක සාමාන්‍ය ව්‍යුහයකි.



හරස්කඩ



දික්කඩ

ඉහත රූප සටහන්වලින් දැක්වෙන්නේ,

(1) කපු කෙන්ද්‍රක ව්‍යුහයකි. (2) සේද කෙන්ද්‍රක ව්‍යුහයකි.

(3) ලෝම කෙන්ද්‍රක ව්‍යුහයකි. (4) නයිලෝන් කෙන්ද්‍රක ව්‍යුහයකි.

(5) රෙයෝන් කෙන්ද්‍රක ව්‍යුහයකි. (......)

(46) පතුරම් භාවිතා කර සාරි හැට්ටය කපා ගැනීමේ පියවර කිහිපයක් පහත දැක්වේ.

A අල්පෙනිති ගසා රැඳවීම.

B පතුරෙම රෙද්ද මත ඇතිරීම.

C ඇඳුමේ කොටස් කපා ගැනීම.

D දක්කු රේඛා ලකුණු කිරීම.

E රැළි ඉවත් කිරීමට රත් වූ ස්ත්‍රීක්කයකින් මැද ගැනීම.

මේවා අතුරින් නිවැරදි අනුපිළිවෙල දැක්වෙන්නේ,

(1) E, B, A, C, D හි ය. (2) A, E, B, C, D හි ය. (3) C, D, E, B, A හි ය.

(4) D, E, C, B, A හි ය. (5) E, A, B, C, D හි ය. (......)

(47) නිමි ඇඳුම් කිහිපයක නඩත්තුව පිළිබඳව දැක්වෙන ආරක්ෂිත ලේබල් වල පහත දැක්වෙන සංකේත සඳහන් ව තිබුණි.



A **B** **C** **D** **E**

තෙතමනය තිබිය දීම එල්ලා වියළීම කළ යුතුය. සහ යන්ත්‍රානුසාරයෙන් වියළීම නොකළ යුතුය යන උපදෙස් පිළිවෙලින් දැක්වෙන්නේ පහත සඳහන් කුමන ලේබල්වලින් ද?

(1) B හා D (2) B හා C (3) C හා D

(4) D හා E (5) A හා E (......)

(48) කාන්තා ඇඳුමක කඳ කොටසෙහි විවිධ වෙනස්කම් සිදු කරන ආකාරය දැක්වෙන රූප සටහන් කිහිපයක් පහත දැක්වේ.



A B C D E

මින් උරහිස බෑවුම වැඩියෙන් අවශ්‍ය අවස්ථාවකදී එය නිවැරදිව කරන ආකාරය දැක්වෙන රූප සටහන වන්නේ මින් කුමක්ද?

(1) A රූපය (2) B රූපය (3) C රූපය
(4) D රූපය (5) E රූපය (......)

(49) තාපවත් වූ රෝලර් අතරින් යවා තෙරපීම මගින් රෙදිවල රැළි ඉවත් කිරීම රෙදි පිළිවෙලට යොදන යාන්ත්‍රික නිමාවකි. එම නිමාව වනුයේ මින් කුමක්ද?

(1) ටෙන්ටරිකරණය යි. (2) සැන්ෆරකරණය යි. (3) ක්ලැන්ඩරිකරණය යි.
(4) ක්‍රේප් කිරීම යි. (5) ගෑස් කිරීම යි. (......)

(50) කෙඳි හඳුනාගැනීම සඳහා කෙන්දක් සාන්ද්‍ර සල්පියුරික් අම්ලයෙහි බහාලු ශිෂ්‍යාවක් එම පරීක්ෂණ සඳහා යොදා ගත් කෙන්ද විය හැක්කේ,

(1) නයිලෝන් ය. (2) ලිනන් ය. (3) ලෝම ය.
(4) කපු ය. (5) රේයෝන්ය. (......)

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ගෘහ ආර්ථික විද්‍යාව - II

13 ශ්‍රේණිය | **කාලය පැය 03 යි.**

- පළමුවන කොටසින් පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට ද, දෙවන කොටසින් පස්වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න

I කොටස

01. පවුලේ සියළුම සාමාජිකයන්ට සතුටින්, ප්‍රීතියෙන් සහ සාමයෙන් ජීවත්වීමට තනාගන්නා ස්ථානය ගෘහයයි. ගෘහයක් නිර්මාණය කිරීමේදී ගෘහ සැලසුම් මූලධර්ම අනුගමනය කිරීමෙන් පවුලේ සාමාජිකයින්ගේ අභිමතාර්ථ බොහෝ දුරට ඉටුකර ගත හැකි වේ. සැලසුම්සහගත ගෘහයක කළමනාකරණ ක්‍රියාවලියේදී ද, පවුලේ සාමාජිකයින්ගේ කාර්යයන් ඵලදායි කරගැනීමට මෙන්ම සාර්ථක කරගැනීමටද හැකි වේ.

(1) ගෘහ සැලසුම් ඇඳීමේ මූල ධර්ම 4 ක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(2) ප්‍රධාන පාරකට මුහුණලා තනන ලද නිවසක ඉදිරි මිදුල මීටර් 2.5 ට සීමා වී ඇත. නිවැසියන්ගේ පෞද්ගලිකත්වය සහ නිදහස ආරක්ෂා කර ගැනීම සඳහා (බාහිර හා අභ්‍යන්තර වශයෙන්) ඔබ අනුගමනය කරන කරුණු 4 ක් ලියන්න.

(3) බිරිඳ, පියා සහ නව වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන දියණියක් පමණක් සිටින මධ්‍යම පන්තික පවුලකට සුදුසු ගෘහයක බිම් සැලැස්මක් පරිමාණයකට අඳින්න.

(4) දියණියගේ කාමරය සඳහා එක වර්ණ ගැලපුමක් සුදුසු යැයි ඇය තීරණය කරයි. එම ගැලපුම සඳහා ඔබ තෝරාගන්නා වර්ණය සඳහන් කර එම වර්ණය යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(5) (අ) ගෘහයට ලැබෙන මුදල් කළමනාකරණයේදී අවධාරණය කළ යුතු කරුණු සඳහන් කරන්න.

(ආ) ගෘහයේ වෙසෙන්නන්ගේ නීරෝගී භාවය හා සැප පහසුව සඳහා ගෘහයට ලැබෙන ආලෝකය හා වාතාශ්‍රය බෙහෙවින් බලපායි. ගෘහය තුළ ක්‍රියාත්මක විය යුතු සංවාතන ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ජලය සහ විදුලිය පිරිමැසීම රටේ ජාතික අවශ්‍යතාවයකි. එය ගෘහීය මට්ටමින් ආරම්භ කළ යුතු ඉතා වැදගත් කරුණකි.

(1) විදුලි බිල්පත වැඩි වීම පාරිභෝගිකයින් මුහුණ දී ඇති බලවත් ගැටළුවකි. එම බිල්පත අවම කර ගැනීම සඳහා ගෘහීය මට්ටමින් ගතහැකි ක්‍රියාමාර්ග සඳහන් කරන්න.

(2) ගෘහස්ථ පරිභෝජනය සඳහා බොහෝ විට භාවිතා කරනු ලබන්නේ මෘදු ජලයයි. පිරිසිදු පානීය ජලයෙහි ප්‍රධාන ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.

(3) (අ) නිවසේදී ජලය පිරිසිදු කර ගත හැකි ක්‍රම මොනවාද?

(ආ) ජල පරිභෝජිකයන්ගෙන් සෑම මාසයකදීම ස්ථාවර මාසික ගාස්තුවක් අය කරයි. එම ගාස්තුව කොපමණද?

(4) (අ) ජල ඒකකයක් සඳහා අයකිරීම විශේෂ සේවා අවශ්‍යතා මත වෙනස් වේ. එවැනි සේවා අවශ්‍යතා 4 කට උදාහරණ දෙන්න.

(ආ) ජල මුද්‍රිත වැසිකිලියක ප්‍රධාන කොටස් 3 ක් සඳහන් කර ඉන් එකක් පැහැදිලි කරන්න.

(5) අපද්‍රව්‍ය දමා ඉඩම් ගොඩකිරීම නාගරිකව බහුලව දැකිය හැකි ක්‍රමයකි. එය ක්‍රමානුකූලව නොකළහොත් අත්විඳීමට සිදුවන ඵලවිපාක 4 ක් පැහැදිලි කරන්න.

03. (1) කඳ කොටසෙහි මූලික පතරොම නිර්මාණයට අවශ්‍ය මිම් නම් කරන්න.

(2) පපුව හා ඉන මිම්ම ගණනය කරන අයුරු පැහැදිලි කරන්න.

(3) කඳ කොටසෙහි ඉදිරිපස මූලික පතරොම, නිර්මාණය කරන අයුරු රූපසටහනක් ඇසුරින් දක්වන්න.

(4) (අ) සාරි හැට්ටය සඳහා මූලික පතරොම් පිටුපස ඉණ ආරය සකස් කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(ආ) සාරි හැට්ටයේ කර නිමාකර ගන්නා ආකාරය විස්තර කරන්න.

04. (1) නිඳන කාමරය සඳහා යෝග්‍ය බිම් සැලැස්මක් පරිමාණයට ඇඳ එහි ගෘහ භාණ්ඩ තැන්පත් කරන ආකාරය දක්වන්න.

(2) (අ) විසිත්ත කාමර සඳහා යෝග්‍ය තිර රෙදි 2 ක් නම් කරන්න.

(ආ) ඔබ නම් කළ එක් මෝස්තරයක් රූප සටහන් ඇසුරින් දක්වන්න.

(3) (අ) නිඳන කාමරයේ ඇඳ වැස්ම සඳහා පිරි සැකසුම සකස් කරන අයුරු පැහැදිලි කරන්න.

(ආ) ඇඳ වැස්මේ අද්දර අලංකාර ලෙස නිම කිරීමේ ක්‍රම 2 ක් නම් කර එක් ක්‍රමයක් නිම කරගන්නා ආකාරය පැහැදිලි කරන්න.

II කොටස

- **පස්වන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 3 ක් ඇතුළුව ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

05. 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන විශ්වන් ක්‍රියාශීලී, සමාජශීලී, නායකත්වය ගෙන කටයුතු කළ හැකි එහෙත් දෙමාපියන්ගේ බසට ඇහුම්කන් නොදෙන ළමයෙකි.

(1) විශ්වන්ට පාසලට රැගෙන යාම සඳහා දිවා ආහාර වේලක් සැලසුම් කරන්න.

(2) විශ්වන්ගේ මව ඇගේ මවට ආහාර වේලක් සකස් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු සඳහන් කරන්න.

(3) මෙම දරුවා පසුකරන අවධිය, විශේෂ වීමට හේතු පැහැදිලි කරන්න.

(4) විශ්වන්ගේ නොගැලපෙන හැසිරීම් රටා, අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.

(5) පසු ළමා වියේ දරුවාගේ කායික වර්ධනය කෙරෙහි බලපාන සාධක 4 ක් දක්වන්න.

06. (1) පසු ළමා වියේ දරුවා පෙන්නුම් කරන භාවිතයන් 4 ක් දක්වා ඉන් 2 ක් විස්තර කරන්න.

(2) දරුවා තුළ තිබිය යුතු යහපත් සමාජමය හැසිරීම් රටා 4 ක් පැහැදිලි කරන්න.

(3) යෞවනයන් යොමු විය හැකි සමාජ විරෝධී ක්‍රියා 4 ක් නම් කරන්න.

(4) ඔබේ මිතුරෙකු එවැනි සමාජ විරෝධී ක්‍රියාවක නිරත වන්නේ නම් ඔබ කරන්නේ කුමක්ද?

07. යෞවන වියේ පසුවන නුවන්තිකාගේ උපන්දිනය නිමිත්තෙන් පැමිණෙන යෙහෙළියන් වෙනුවෙන් සුළු කෑම වර්ග රාශියක් ඇගේ නිවසේ පිළියෙල විය.

(1) ෂෝට් ක්‍රස්ට් පිටි මෝලියේ හා පාන්පිටි මෝලියේ දැකිය හැකි වෙනස්කම් දක්වන්න.

(2) පාන්පිටි මෝලියේ පිපිමේ ක්‍රියාවලිය විස්තර කරන්න.

(3) ෂෝට් ක්‍රස්ට් පිටි මෝලිය භාවිතයෙන් සකස් කළ හැකි ආහාර වර්ග 2 ක් නම් කර ඉන් එක් වර්ගයක් සකස් කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ලැයිස්තුගත කරන්න.

(4) නුවන්තිකාගේ උපන්දින සාදයට ආහාර වට්ටෝරුවක් සැලසුම් කරන්න.

08. පහත දක්වා ඇත්තේ දියවැඩියා රෝගයෙන් පෙළෙන අය සඳහා පිළියෙල වූ රාත්‍රී ආහාර වට්ටෝරුවකි.

ඉඳිආප්ප
තොර මාළු කිරි හොදි
ඇඹරැල්ලා චට්නි
පළතුරු සලාද

(1) ඉහත සඳහන් ආහාර වට්ටෝරුව ඔහුට යෝග්‍ය, අයෝග්‍ය බව පැහැදිලි කරන්න.

(2) මෙම වට්ටෝරුව දියවැඩියා රෝගියෙකුට යෝග්‍ය ලෙස නැවත සැලසුම් කරන්න.

(3) මෙම රෝගියා සඳහා තෝරා නොගත් හෝ අවම ගත යුතු ආහාර ලැයිස්තුවක් පිළියෙල කරන්න.

(4) "ගැස්ට්‍රයිටිස්" ඇති වීමට හේතු විස්තර කරන්න.

09. (1) මවගේ සහ දරුවාගේ සුභ සිද්ධිය උදෙසා ගර්භණී මවකට ලබා දිය යුතු රැකවරණය හා උපදෙස් මොනවාද? කරුණු 4 ක් දක්වන්න.

(2) ඩිම්බය හා ශුක්‍රාණුව අතර ඇති වෙනස්කම් කරුණු 4 ක් ඇසුරෙන් සන්සන්දනය කරන්න.

(3) ගර්භණී අවදියේදී මවට වැළඳෙන සමහර රෝග නිසා භ්‍රෑණයේ විකෘතිතා ඇතිවිය හැකිය. මෙසේ විකෘතිතා ඇති වීමට හේතුවන රෝග 4 ක් ලියන්න.

(4) (අ) ඒඩ්ස් රෝගය වළක්වාලීම සඳහා යෞවනයන් දැනුවත් කිරීමට ඉදිරිපත් කළ හැකි කරුණු 4 ක් යෝජනා කරන්න.

(ආ) ළමා සෞඛ්‍ය වර්ධන සටහන් පතේ පහත දැක්වෙන තොරතුරු දෙකක් සටහන් කර එය දරුවාගේ වර්ධනය දැන ගැනීමට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

The National e-learning Portal for The General Education